*සැ. යු.* - 2014.10.17 වැනි දින පළ වූ අංක 1,885 දරන *ගැසට් පත්‍රයේ* I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,886 - 2014 ඔක්තෝබර් මස 24 වැනි සිකුරාදා - 2014.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 222 |


*සැ. යු.*- විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත, 2014 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ඔක්තෝබර් මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* *www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

221 - B 80885 - 300 (2014/10)
E -1

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/37077.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉකො /ඉ6/පුත්/දී.බ/ ලංකා බැංකුව.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 618, පුත්. දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුත්තලම ගමේ මු. පි. පු. 4844 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.2045ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් පුත්තලම ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාමට ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ලංකා බැංකුව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලොට් 24න් කොටසක් ; |
| *නැගෙනහිරට* | : | පී. පී. ඒ. 408 හි ලොට් 01 ; |
| *දකුණට* | : | ලොට් 02 ; |
| *බටහිරට* | : | පී. පී. ඒ. 1022 හි ලොට් 25 සහ පි. පි. පු. 4794 හි ලොට් 01. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (ගරු ඇමතිතුමා අනුමත කළ 2013.08.19 වැනි දින සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2013 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50%කට නොඅඩු විය යුතු ය.
*වාර මුදල*.- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ලංකා බැංකුව පවත්වාගෙන යාම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2013.08.19 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2014 ඔක්තෝබර් මස 02 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර" රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10-797

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/33531.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/12/0304.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 18, කැබිතිගොල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ කැබිතිගොල්ලෑව කඩවීදිය ගමේ වී. පී. 1652 පිඹුරේ කැබලි අංක 363, 366, 380, 386 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0963ක් වාණිජ කටයුතු සඳහා සාමාන්‍යාධිකාරී ලංකා බැංකුව- කැබිතිගොල්ලෑව ශාඛාව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

කට්ටි අංක 363 (ප්‍රමාණය හෙක්. 0.0097)

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 364 2/2, 362 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 380, 386 ; |
| *දකුණට* | : | කැබලි අංක 386, 389, 388 364 1/2 ; |
| *බටහිරට* | : | කැබලි අංක 364 2/2. |

*කට්ටි අංක 366 (ප්‍රමාණය හෙක්. 0.0156)*

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 365 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 365, 367 ; |
| *දකුණට* | : | කැබලි අංක 367, 379, 380 ; |
| *බටහිරට* | : | කැබලි අංක 380, 381. |

*කට්ටි අංක 380 (ප්‍රමාණය හෙක්. 0.0311)*

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 363, 362, 381, 366 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 366, 367, 379 ; |
| *දකුණට* | : | කැබලි අංක 379, 387, 386 ; |
| *බටහිරට* | : | කැබලි අංක 386, 363. |

*කට්ටි අංක 386 (ප්‍රමාණය හෙක්. 0.0399)*

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 363, 380 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 380 ; |
| *දකුණට* | : | කැබලි අංක 387, 388 ; |
| *බටහිරට* | : | කැබලි අංක 388, 363, 364 1/2. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2011.09.16 සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2011 වර්ෂයේ ඉඩමේ වාණිජමය වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50%කට නොඅඩු විය යුතු ය.

*වාර මුදල*.- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2011.09.16 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

අංක 1200/6 හි, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර" රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10-798

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/36940.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/එල් 11/23/04.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 167, පොත්ගුල් පෙදෙස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පොත්ගුල් පෙදෙස ගමේ සංවර්ධන සහකාර ඒ. ජී. කේ. ගමගේ මහතා විසින් 2012.12.11 දිනැතිව අඳින ලද දළ අනුරේඛනයේ කැබලි අංක - වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 36ක් සමිති කටයුතු සඳහා මෛත්‍රීපාල සිරිසේන ලක්දරු දිරිය පදනම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | නේවාසික ව්‍යාපාර කලමනාකරණ කාර්යාලය ; |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන පාර ; |
| *දකුණට* | : | දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය ; |
| *බටහිරට* | : | දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), ( 2013.05.08 සිට ඉදිරියට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2013 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝප්පින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඉ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) අවුරුදු 5ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එල්. පී. චාමිකා සුබෝධිනී,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

අංක 1200/6 හි, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර" රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10-799

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.